" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / பொது இலக்கம் / General Telephone — 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/05 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2019-06-10

පාලන චක්‍රලේඛ අංක : 05/2019

ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),

සභා ලේකම් (බ.ප),

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් (බ.ප),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),

පළාත් ආදායම් කොමසාරිස්, ආදායම් දෙපාර්තමේන්තුව (බ.ප.),

ප්‍රධාන අභ්‍යන්තර විගණක ,අභ්‍යන්තර විගණන අංශය (බ.ප.),

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් / පරිපාලන නිලධාරී,

<u>රාජ්‍ය පොසොන් උත්සවය සැමරීම - 2019.</u>

2019 ජුනි මස 16 වන ඉරුදිනට යෙදෙන පොසොන් පොහොය නිමිති කර ගෙන මෙවර පොසොන් උත්සවය වෙනුවෙන් 2019 ජුනි මස 12 වන දින සිට 18 වන දින දක්වා කාල සීමාව පොසොන් සතිය ලෙස රජය ප්‍රකාශයට පත් කර ඇත. මෙම පොසොන් සතිය සැමරීම සම්බන්ධයෙන් උපදෙස් නිකුත් කරමින් 2019.06.07 දිනැතිව අභ්‍යන්තර, ස්වදේශ කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක 18/2019 දරණ චක්‍රලේඛයට සමගාමීව නිකුත් කරනු ලබන මෙම චක්‍රලේඛය අනුව බස්නාහිර පළාත් සභාව යටතේ පවත්නා සියළු ආයතන පොසොන් උත්සවය සැමරීමට අවශ්‍ය වැඩසටහන් සංවිධානය කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

01. 2019 ජුනි 12 වෙනි දින සිට 18 වෙනි දින දක්වා පළාත් සභාවට අදාල සියළු ආයතනවල බෞද්ධ කොඩිය ඔසවා තැබීම හා ගොඩනැගිලි බෞද්ධ කොඩි හා පොසොන් සැරසිලි වලින් සරසා තැබීම.

02. "සබ්බේ තසන්ති දණ්ඩස්ස" (සියළු සත්වයෝ දඬුවමට බිය වෙති) යන තේමා පාඨය මෙවර පොසොන් තේමා පාඨය ලෙස තෝරා ගෙන ඇති බැවින් එය මූලික කර ගෙන විවිධ පොසොන් වැඩසටහන් ආයතන මට්ටමින් සංවිධානය කිරීම.

03. සියළුම අන්‍යාගමිකයන්ගේ සහයෝගය ලැබෙන පරිදි සහ ආගමික සංහිඳියාව වර්ධනය වන ආකාරයට පොසොන් උත්සවය සැමරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

ඉහතින් දක්වා ඇති පරිදි වැඩසටහන් සංවිධානය කරන ලෙසත් ඔබ යටතේ ඇති සියළුම ආයතන හා නිලධාරීන් දැනුවත් කර සියළු දෙනාගේ දායකත්වය ලැබෙන පරිදි වැඩකටයුතු සංවිධානය කරන ලෙසත් කාරුණිකව දන්වමි.

ප්‍රදීප් යසරත්න

ප්‍රධාන ලේකම්

බස්නාහිර පළාත.

පිටපත් :

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. ලේකම්, අභ්‍යන්තර, ස්වදේශ කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
04. ආණ්ඩුකාර ලේකම් (බ.ප.)

} කරු.දැ.ගැ.ස.